# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 273 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 15/02/2024 පැය 1920

## මාධ්‍ය නිවේදනය

**ආදුරුප්පුවීදිය පොලිස් ස්ථානයේ රැඳවුම් නියෝග මත රඳවා සිටි සැකකරුවන් හට වස මිශ්‍ර පානයක් ලබා දී ඝාතනය කිරීමට තැත් කිරීමේ අපරාධයට ආධාර අනුබල දීම සම්බන්ධව සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම - කොළඹ අපරාධ කොට්ඨාසය**

2024.01.24 වන දින ආදුරුප්පුවීදියේ පොලිස් වසමේ පුද්ගලයෙකු වෙඩි තබා ඝාතනය කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයේ සිරමැදිරියේ රඳවා සිටි සැකකරුවන් දෙදෙනෙකු 2024.02.07 වන දින ඔවුන් බැලීමට පිටතින් පැමිණි පුද්ගලයකු විසින් ලබා දුන් වස මිශ්‍ර කිරි පානයක් පානය කිරීම හේතුවෙන් අසාධ්‍ය තත්වයේ රෝහල් ගත කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

2024.02.14 වන දින දහවල් කාලයේ කොටහේන හා ඔරුගොඩවත්ත ප්‍රදේශවලදී මෙම අපරාධයට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් සැකකරුවන් තිදෙනෙකු කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් අවුරුදු 22, 24 හා 26 වයස් වල පසුවන කොටහේන, ඔරුගොඩවත්ත හා කොළඹ 13 ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම අපරාධය සැලසුම් කරන ලද්දක් බවටත්, විදේශගතව සිටින අපරාධකරුවෙකුගේ උපදෙස් මත මෙය සිදු කර ඇති බවටත් දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත. කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**